# රුහුණ විශ්වවිද්‍යාලය

# 2026/2027 වර්ෂය සඳහා පහත සඳහන් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන කැඳවීම.

රුහුණ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ආපනශාලාවන් සඳහා **2026/2027** වර්ෂය තුළදී ආහාර පාන සැපයීම සඳහා ආපනශාලාව පවත්වාගෙන යාමට පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් **2026.03.05** දින ප.ව. 2.00 දක්වා ප්‍රසම්පාදන අයදුම්පත්‍ර භාරගනු ලැබේ.

සේවාව අවශ්‍ය කරන ආපනශාලාවන්

01. සම සෞඛ්‍ය විද්‍යා පීඨ ශිෂ්‍ය ආපනශාලාව
02. කෘෂිකර්ම පීඨ සේවක ආපනශාලාව
03. වැල්ලමඩම අංක 03 කාන්තා නේවාසිකාගාර ආපනශාලාව

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර සහ විස්තර ලබා ගැනීම සඳහා ආපසු ගෙවනු නොලබන රු.1000.00 ක ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය ශිෂ්‍ය කටයුතු අංශයේ සහකාර ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

කාර්යාල දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 අතර වේලාවන් තුළදී ශිෂ්‍ය කටයුතු අංශයට පැමිණීමෙන් **2026.02.16** දින සිට **2026.03.03** දින දක්වා ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය තුළ ආපනශාලා පවත්වාගෙන යාමට නුසුදුසු බවට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති කිසිදු ආයතනයකට හෝ පුද්ගලයකුට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලබනු ඇත.

සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන අයදුම්පත් මුද්‍රා තබා නියමිත දිනට පෙර සභාපති / විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර (**2026.03.05** දිනට පෙර ලැබිය යුතුවේ.) ගෙනවිත් භාර දෙන්නේ නම් ලේඛකාධිකාරි කාර්යාලයේ ඇති අංක 01 දරණ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. අදාළ **ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආපනශාලාවේ නම"** පැහැදිලිව සඳහන් කල යුතුය.

**2026.03.05** දින ප.ව. 2.30 ට ප්‍රසම්පාදන විවෘත කරන අතර ඔබට හෝ ඔබගේ නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය. (විමසීම් - 041-2227004 දිගුව 12040/12041)

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව
රුහුණ විශ්වවිද්‍යාලය
2026.02.13